## ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

## කොළඹ

## පුවත්පත් නිවේදනය

## මහනුවර, සහකාර මහ කොමසාරිස් කාර්යාලය පිහිටුවා වසර 100ක් සපිරීම නිමිත්තෙන් විශේෂ ලාංඡනයක් එළි දැක්වේ

මහනුවර, සහකාර මහ කොමසාරිස් කාර්යාලය පිහිටුවා වසර 100ක් සපිරීම නිමිත්තෙන් විශේෂ ලාංඡනයක් එළි දැක්වීමේ උත්සවයක් මහනුවර, සහකාර මහ කොමසාරිස් කාර්යාලය විසින් 2023 මැයි 26 වන දින සංවිධානය කර තිබිණ.

2. ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා අතථ්‍ය අයුරින් මෙම අවස්ථාව හා එක් වෙමින් ලාංඡනය එළි දැක්වීය. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. වේලු කුමාර් මහතා විශේෂ ආරාධිත අමුත්තා වශයෙන් මෙම අවස්ථාවට සහභාගී විය. විවිධ සමාජ සහ සංස්කෘතික සංවිධානවල නියෝජිතයන්, ඉන්දියානු ඩයස්පෝරා සාමාජිකයන් සහ ඉන්දියාවේ මිතුරන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

3. මෙම අවස්ථාවේ අදහස් දක්වමින් මහ කොමසාරිස්තුමා පසුගිය වසර 100 තුළ මහනුවර, සහකාර මහ කොමසාරිස් කාර්යාලයට විවිධාකාරයෙන් සහය ලබාදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා බලධාරීන්ට සිය ස්තුතිය පළ කළේය. 2023 වසර මහනුවර, සහකාර මහ කොමසාරිස් කාර්යාලය පිහිටුවා වසර 100ක් සපිරීම මෙන්ම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිහිටුවා වසර 75ක් සපිරීම හේතුවෙන් දෙරට අතර ද්විපාර්ශවික සබඳතා සම්බන්ධයෙන් ඉතා වැදගත් වසරක් වන බව එතුමා සඳහන් කළේය. එසේම, 2023 වසර ඉන්දියානු සම්භවයක් සහිත දමිළ ප්‍රජාව ද ලංකාවට පැමිණ වසර 200ක් සම්පූර්ණ වීම සනිටුහන්

කරයි. එම ප්‍රජාව ශ්‍රී ලංකාවේ සමස්ත සංවර්ධනය සඳහා ලබා දුන් දායකත්වයන් සිහිපත් කළ මහ කොමසාරිස්තුමා දෙරටෙහිම ජනතාවගේ සුබසිද්ධිය උදෙසා එක්ව කටයුතු කිරීමට ඉන්දියාව දක්වන කැපවීම අවධාරණය කළේය.

4. මෙම ලාංඡනය MyGov විසින් පවත්වන ලද ලාංඡන නිර්මාණ තරඟයකින් තෝරා ගෙන ඇත. එම තරඟය සඳහා තරඟකරුවන් 470 දෙනෙකු සහභාගී වූහ. රායිස් අහ්මද් භාත් මහතා විසින් නිර්මාණය කරන ලද ජයග්‍රාහී ලාංඡනය ඉන්දීය සහ ශ්‍රී ලංකා ජාතික ධජයන්හි වර්ණයන් සහ ජාතික සංකේත සංකලනය කරමින් මුඛ්‍ය තේමාව පිළිඹිබු කරයි.

5. ශ්‍රී ලංකාවේ තේ වතුවල සේවය කරන ඉන්දීය සම්භවයක් සහිත සංක්‍රමණික කම්කරුවන්ගේ සුබ සාධනය පිළිබඳ සොයා බැලීම සඳහා 1923 වර්ෂයේ දී මහනුවර දී “ඉන්දීය රජයේ නියෝජිතයාගේ කාර්යාලය” පිහිටුවන ලදී. 1947 වසරේ දී ඉන්දියාව නිදහස ලබා ගැනීමෙන් පසුව, අභාවප්‍රාප්ත ශ්‍රී වී. වී. ගිරි මහතා වීසා නිලධාරියා වශයෙන් එම කාර්යාලයේ ප්‍රධානත්වය ඉසිළීය. පසුව එම මහතා ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉන්දීය මහ කොමසාරිස්වරයා වූ අතර 1969 වසරේ දී ඉන්දියාවේ ජනාධිපතිවරයා බවට ද පත් විය. 1965 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී එම කාර්යාලය මහනුවර, සහකාර මහ කොමසාරිස් කාර්යාලය වශයෙන් නම් කරන ලදී.

***

කොළඹ
2023 මැයි 27